Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**7 ශ්‍රේණිය** | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | **34 S I**



විද්‍යාව I | **කාලය පැය දෙකයි**

**සැලකිය යුතුයි :-**
- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්තය.
- I හා II ලිඛිත පත්‍ර වන අතර III ප්‍රායෝගික පත්‍රවේ.
- I කොටසෙහි ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- II කොටසෙහි ප්‍රශ්න අංක 1 හා 2 ඇතුළත්ව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

01. බර මනිනු ලබන අන්තර්ජාතික සම්මත ඒකකය,
 (1) කිලෝග්‍රෑම් (2) නිව්ටන් (3) ග්‍රෑම් (4) රාත්තල්

02. ශාක මුල් වර්ග හා ඒවාට අදාල උදාහරණ නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක්ද?
 (1) කරු මුල් - වැටකේ (2) වායව මුල් - කඩොල් (3) ආරෝහක මුල් - බුලත් (4) සංචිත මුල් - කිරි අල


03. ස්ථිති විද්‍යුත් ආරෝපන ගබඩා කරන උපාංගය, සංකේතය හා ඒකකය නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
 (1) ධාරිත්‍රකය,  , ෆැරඩ් (3) ඩයෝඩය,  , ෆැරඩ්
 (3) කෝෂය  , වෝල්ට් (4) ධාරිත්‍රකය,  , ඇම්පියර්

04. අපෘෂ්ටවංශීන් පමණක් අයත් පිළිතුර තෝරන්න.
 (1) කුරුමිනියා, කුඩැල්ලා, හූණා (2) සමනලයා, ගොළුබෙල්ලා, ඉස්සා
 (3) කැස්බෑවා, පසගිල්ලා, කකුළුවා (4) බෙල්ලා, මුහුදු මල, ගෙම්බා

05. විද්‍යාගාර පරීක්ෂණ වලදී ජලවාෂ්ප හඳුනා ගැනීමට යොදාගනු ලබන රසායනික සංයෝගයක් හා එහි වර්ණය පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
 (1) කොපර් සල්ෆේට්, නිල් (2) නිර්ජලීය කොපල් සල්ෆේට් , නිල්
 (3) කොපර් සල්ෆේට්, සුදු (4) නිර්ජලීය කොපර් සල්ෆේට් - සුදු


**ස්ථිති විද්‍යුත් ආරෝපණය ඇතිවන ආකාරය පෙන්වන රූපසටහනක් පහතින් දක්වේ. ඒ අයුරින් 6, 7 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

(පිරිමැදීමේ)




1 රූප සටහන

(පිරිමැදීමෙන් පසු)




2 රූප සටහන


06. නිවැරදි වගන්තිය තෝරන්න.
 පළමු රූපසටහනේ ඊතල වලින් පෙන්වන්නේ,
 (1) + ආරෝපන ගමන් කරන ආකාරයයි. (2) ඉලෙක්ට්‍රෝන ගමන් කරන ආකාරයයි.
 (3) + හා - ආරෝපන හුවමාරු වන ආකාරයයි. (4) ස්ථිති විද්‍යුතය ගමන් කරන ආකාරයයි.

07. A හා B සඳහා සුදුසු ද්‍රව්‍ය පිළිවෙලින් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
 (1) වීදුරු - ලෝම (2) වීදුරු - සේද (3) එබනයිට් - සේද (4) එබනයිට් - ලෝහ

08. වායුගෝලීය ස්ථර අතරින් ඕසෝන් වියන පිහිටා ඇති ස්තරය කුමක්ද?
 (1) පරිවර්ති ගෝලය (2) තාප ගෝලය (3) ස්තර ගෝලය (4) මධ්‍ය ගෝලය

09. ඩයිනමෝවක කාර්යක්ෂමතාව වැඩිකර ගැනීම සඳහා යොදා ගත හැකි ක්‍රම කිහිපයක් පහත දක්වේ. ඉන් ගැලපෙන ක්‍රමය වන්නේ,
 A - ප්‍රබලතාවයෙන් වැඩි චුම්බකයක් භාවිතා කිරීම. B - දඟරයේ පොට සංඛ්‍යාව වැඩිකර ගැනීම
 C - චලන වේගය වැඩිකර ගැනීම
 (1) A හා C (2) A හා B (3) B හා C (4) A, B හා C

10. පුෂ්පයක ජායාංගයට අයත් කොටස් දක්වෙන රූප සටහනක් පහත දක්වේ. එහි A,B,C,D කොටස් පිළිවෙලින් නම් කල පිලිතුර වන්නේ,




(1) කලංකය, කීලය, ඩිම්බකෝෂය, ඩිම්බ
(2) කලංකය, කීලය, ඩිම්බ, ඩිම්බ කෝෂය
(3) කීලය, කලංකය, ඩිම්බ කෝෂය, ඩිම්බ
(4) ඩිම්බ, ඩිම්බ කෝෂය, කීලය, කලංකය

11. උත්තල දර්පණයකින් සෑදෙන ප්‍රතිබිම්බයක ලක්ෂණයක් නොවන්නේ,

(1) උඩුකුරු බව
(2) වස්තුවට වඩා කුඩා බව
(3) තිරයකට ගත හැකි වීම
(4) පාර්ශ්වික අපවර්තනයට ලක්වීම

12. නිල් පැහැති ලිට්මස් කඩදාසියක වර්ණය වෙනස් නොකරන ද්‍රව්‍ය කුමක්ද?

(1)ගොරකා යුෂ
(2) සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් ද්‍රාවණය
(3) විනාකිරි
(4) හයිඩ්‍රොක්ලෝරික් ද්‍රාවණය


13. ඛණිජ වර්ග පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1)ග්‍රැනයිට්, මයිකා, ඉල්මනයිට්
(2) මයිකා, ඉල්මනයිට්, නයිස්
(3) ඩොලමයිට්, ෆෙල්ස්පාර්, මිනිරන්
(4)ඩොලමයිට්, නයිෂ්, මයිකා

14. ශ්‍රී ලංකාව අයත් වන්නේ කුමන භූ තැටියටද?

(1) පිලිපීන භූ තැටිය ට
(2) පැසිෆික් භූ තැටිය ට
(3) ඇන්ටාක්ටිකා භූ තැටිය ට
(4) ඔස්ට්‍රේලියන් ඉන්දියන් භූ තැටිය ට

15. රූපයේ ආකාරයට චුම්බක දඟරය තුලට හා ඉන් ඉවතට ගෙනයන විට දැකිය හැකි නිරීක්ෂණ මොනවාද?




(1) විද්‍යුත් චුම්බක ප්‍රේරණයක් ඇතිවන බව
(2) දඟරය තුලින් ධාරාවක් ගලායන බව
(3) ගැල්වනෝ මීටරයේ කටුව දෙපසට චලනය වන බව
(4) දඟරය තුළින් ප්‍රත්‍යාවර්ත ධාරාවක් ගලායන බව

16. දර්පණ සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.

A - වාහන වල පැති කණ්ණාඩි සඳහා උත්තල දර්පණ භාවිතා කරයි.
B - අන්වීක්ෂයේ වේදිකාව මතට ආලෝකය ලබා ගැනීමට උත්තල දර්පණ භාවිත වේ.
C - අවතල දර්පණයක් ඉදිරියේ වස්තුව තබන ස්ථානය අනුව ලැබෙන ප්‍රතිබිම්බය වෙනස් වේ.

ඉහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1)A හා C (2)A හා B (3) B හා C (4)A, B හා C

17. ධ්වනිය සම්බන්ධ පහත ප්‍රකාශ අතරින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) රික්තක හරහාද ධ්වනි සම්ප්‍රේෂණය සිදුවේ.
(2) ඝන, ද්‍රව, වායු අතරින් වඩා වැඩි වේගයෙන් ධ්වනිය ගමන් කරන්නේ ඝන ද්‍රව්‍ය හරහාය.
(3) ධ්වනිය ගමන් කිරීමට මාධ්‍යක් අවශය නොවේ.
(4) වාතය තුළදී ධ්වනි වේගය ආලෝකයේ වේගයට වඩා වැඩි අගයක් ගනී.

18. උක් ශාක යුෂයේ අඩංගු වන රසායන සංයෝගය කුමක්ද?

(1) සෝඩියම් ක්ලෝරයිඩ් (2) ඇසිටික් අම්ලය (3) සුක්‍රෝස් (4) ෆෘක්ටෝස්

19. ආහාර ජීර්ණ පද්ධතියට අයත් මහන්ත්‍රයේ කාර්යක් වනුයේ,

(1) ආහාර ජීර්ණය
(2) ආහාර අවශෝෂණය
(3) මල ද්‍රව්‍ය බැහැර කිරීම
(4) ජල අවශෝෂණය

20. ශක්ති ප්‍රභව වල තිරසරභාවිතය සඳහා ගත හැකි ක්‍රියාමාර්ගයක් නොවන්නේ,

(1) දෙමුහුන් හෝ විදුලි වාහන භාවිතා කිරීම.
(2) ප්ලාස්ටික් භාවිතය හැකිතාක් අඩු කිරීම.
(3) මාර්ග තද බදය ඇති අවස්ථාවලදී ගමන් යෑමෙන් වැලකී සිටීම.
(4) පොදු වාහන වෙනුවට පෞද්ගලික වාහන යොදා ගැනීම.


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

### A කොටස - ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

අසා ඇති ප්‍රශ්න වලට වඩාත් සුදුසු පිළිතුර දී ඇති හිස්තැනෙහි ලියන්න.

01.




A. i. මෙම රූප සටහනේ දක්නට ලැබෙන පුනර්ජනනීය ශක්ති ප්‍රභව 02ක් ලියන්න.

i. ........................................................ ii. ........................................................ (ලකුණු 02 )

ii. දුම්රිය ධාවනය සඳහා යොදා ගත හැකි ඉන්ධන වර්ගයක් සඳහන් කරන්න.

i. ........................................................ (ලකුණු 01 )

iii. මෙම පරිසරයේ දැකිය හැකි වායු දූෂණයට හේතුවිය හැකි කරුණු 02ක් ලියන්න.

i. ........................................................ ii. ........................................................ (ලකුණු 02 )

iv. මිනිසාට කළුගල් කැඩීමට අවශ්‍ය ශක්තිය ලබාදෙන පෝෂක පදර්ථය කුමක්ද ?

i. ........................................................ (ලකුණු 01 )

v. සූර්යාගේ සිට පෘථිවිය වෙත සූර්ය තාපය සංක්‍රාමණය වන ආකාරය ලියන්න.

i. ........................................................ (ලකුණු 01 )

B. සතුන් විවිධ පරිසරවල ජීවත් වේ. ඔවුන් තම පරිසරයට දක්වන හැඩ ගැසීම් අනුවර්තන ලෙස හැඳින්වේ.

i. ශරීර වර්ණය පරිසර වර්ණය සමඟ ගැලපීම හඳුන්වන්නේ කුමන නමකින්ද?

i. ........................................................ (ලකුණු 01 )

ii. එසේ 1 හි පරිදි අනුවර්තනය වී ඇති සතෙකු නම් කරන්න.

i. ........................................................ (ලකුණු 01 )

iii. එවැනි අනුවර්තන මඟින් සතුන්ට සැලසෙන වාසියක් සඳහන් කරන්න.

i. ........................................................ (ලකුණු 01 )


02. (A)

**රූපයේ දක්වෙන්නේ ශාකවල දක්නට ලැබෙන කොටස් කිහිපයකි.**

A




B



C



i. A රූපයේ X හා Y නම් කරන්න

i. X ........................................................

ii. Y ........................................................ (ලකුණු 02 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ii. A රූපයේ ඇති ශාක කොටස මගින් ශාකයක සිදුකරන ප්‍රධානතම කෘත්‍යය කුමක්ද? (ලකුණු 01)

..............................................................

iii. A රූපයේ දැක්වෙන ආකාරයේ නාරටි වින්‍යාසයක් තිබිය හැක්කේ B හා C අතරින් කුමන ආකාරයේ මුල් ඇති ශාකයකටද? .............................................................. (ලකුණු 01)

iv. B හා C මුල් අයත් ශාකවල දැකිය හැකි වෙනත් වෙනස් කම් 02ක් ලියන්න.

| A | B |
|---|---|
| i. .............................................................. | i. .............................................................. |
| ii. .............................................................. | ii. .............................................................. |

(ලකුණු 02)

(B) පෝෂක සංඝටක හා තන්තු අවශ්‍ය ප්‍රමාණයෙන් යුත් ආහාරයක් තුලිත ආහාරයක් ලෙස හැඳින්වේ.

i. තුලිත ආහාර වේලක් නොගැනීමෙන් ඇතිවන අහිතකර තත්වයක් ලියන්න.

.................................................................................................................................... (ලකුණු 01)

ii. පහත සඳහන් විටමින් ඌන වීමෙන් සෑදෙන ඌනතා රෝග මොනවාද?

A. ඇසේ බිටෝ් ලප - ..............................................................


B. රිකට්සියාව - ..............................................................

C. විදුරුමස් දියවීම - .............................................................. (ලකුණු 03 )

**B කොටස**

- **තෝරාගත් ප්‍රශ්න 3 කට පමණක් පිළිතුරු සපයන්න.**

03. A. **ඔබට පහත දැක්වෙන උපකරණ සපයා ඇත.**



සම්බන්ධක කම්බි  වියළි කෝෂ  බල්බය  ස්විචය

i. ද්‍රව්‍ය ඇසුරින් බල්බය දැල්වීමට සුදුසු පරිපථයකට අදාල රූප සටහනක් අඳින්න. (ලකුණු 02)

ii. බල්බය දැල්වීමේදී සිදුවූ ශක්ති පරිවර්තනය ලියන්න. (ලකුණු 01)

iii. ශක්තිය මනිනු ලබන අන්තර්ජාතික සම්මත ඒකකය කුමක්ද? (ලකුණු 01)

iv. පහත දැක්වෙන අවස්ථාවලට අදාල වන ශක්ති ආකාර ලියන්න. (ලකුණු 05)

A - අදින ලද රබර් පටියක.


B - ජල පහරකට අල්ලන ලද තල බඹරයක.

C - ගුවන් විදුලි යන්ත්‍රයකින් ගීතයක් වාදනය වීම.

D - උණු ජල බඳුනක තැබූ වීදුරු බෝතලයක කටට සවිකල බැලූනයක් පිම්බීම.

E - තනුක හයිඩ්‍රොක්ලෝරික් අම්ල ද්‍රාවණයකට මැග්නීසියම් පටි කැබැල්ලක් දැමූ විට වායු බුබුළු පිටවීම.

B. **මුහුදු ජලයෙන් ලුණු වෙන්කර ගන්නා ආකාරය පෙන්වීමට සිසුවෙක් නිවසේදී සකස් කරගත් අටවුමක් රූපයේ දැක්වේ.**




i. ලුණු ද්‍රාවණය ටින් එකක දමා රත්කරනවාට වඩා පැතලි ටින් පියනක දමා රත්කිරීමේ වාසිය කුමක්ද? (ලකුණු 01 )

ii. ක්‍රියාකාරකම අවසානයේදී ටින් පියන මත බලාපොරොත්තු වියහැකි නිරීක්ෂණය ලියන්න. (ලකුණු 01 )


iii. කිරිපිටි පෙට්ටියේ පහළ කවුළුවක් තැබීමේ අරමුණ කුමක් විය හැකිද? (ලකුණු 01 )

iv. කිරිපිටි පෙට්ටිය වෙනුවට ටින් පියන රැඳවීමට භාවිත කළ හැකි විද්‍යාගාර උපකරණයක් නම් කරන්න. (ලකුණු 01 )

v. මුහුදු ජලය ලුණු රසයකින් යුක්ත වීමට හේතුව ලියන්න. ( ලකුණු 02 )

04.

(A).




**7 ශ්‍රේණියේ සිසුන් කණ්ඩායමක් ධ්වනිය හා සම්බන්ධ ක්‍රියාකාරකමකට සකස් කරන ලද උපකරණ ඇටවුම් 02කට අදාල රූප සටහන් 02 ක් ඉහත දක්වා ඇත.**

i. A හා B ඇටවුම් 02කට විදුලිය සැපයූ විට ලැබිය හැකි නිරීක්ෂණ වෙන වෙනම සඳහන් කරන්න. ( ලකුණු 02 )

ii. B ඇටවුමට අදාළ නිරීක්ෂණය ඇසුරින් ඔබ එළඹෙන නිගමනය කුමක්ද? ( ලකුණු 01 )

iii. ධ්වනි සම්ප්‍රේෂණය යනු කුමක්ද? ( ලකුණු 01 )

iv. ඝන, ද්‍රව හා වායු මධ්‍ය තුලින් ධ්වනි ප්‍රවේගය වැඩි වන ආකාරය පෙළගස්වන්න. ( ලකුණු 01)

v. අකුණු ගැසීම සිදුවන අවස්ථාවක ආලෝකය දර්ශනය වී සුළු වේලාවකට පසු ගිගුරුම් හඬ ඇතිවීමට හේතුව පැහැදිලි කරන්න. ( ලකුණු 02 )

(B) **පහත රූප සටහනේ දැක්වෙන්නේ උෂ්ණත්ව මාන 02කි. එම රූප ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**




i. ඉහත A හා B උෂ්ණත්වමාන හඳුනාගෙන නම් කරන්න. (ලකුණු 02)

ii. එම උෂ්ණත්වමාන එසේ වෙන්කොට හඳුනා ගැනීම ඉවහල් වූ ලක්ෂණ 02ක් ලියන්න. (ලකුණු 02)


iii. උෂ්ණත්වමානයක බල්බය පිරවීමට යොදා ගන්නා ද්‍රවයක් නම් කරන්න. (ලකුණු 01)

iv. උෂ්ණත්වමානයක් පරිහරණයේදී සැලකිලිමත්විය යුතු කරුණක් ලියන්න. (ලකුණු 01)

v. උෂ්ණත්වමාන නිපදවා ඇත්තේ ද්‍රව සතු කවර ගුණයක් පදනම් කර ගෙනද? (ලකුණු 01)

vi. මිනිස් සිරුරේ සාමාන්‍ය උෂ්ණත්වය කොපමණද? (ලකුණු 01)

05. (A)**විද්‍යුතය නිපදවා ගැනීමට සිසුන් පිරිසක් සකස් කරගත් ඇටවුමක් රූපයේ දැක්වේ.**




i. ඉහත ඇටවුම මිලි ඇමීටරයකට සම්බන්ධ කල විට ලැබෙන නිරීක්ෂණය කුමක්ද? ( ලකුණු 01 )

ii. මෙහි ධන (+) අග්‍රය හා ඍණ අග්‍රය (-) නම් කරන්න.

\+ අග්‍රය :- ........................................................ - අග්‍රය :- ........................................................ ( ලකුණු 02 )


iii. මෙම ඇටවුමේ දෙහි වෙනුවට විද්‍යාගාරයේදී භාවිතා කළ හැකි අම්ලයක් ලියන්න. ( ලකුණු 01 )

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

iv. මෙම ඇටවුම ආකාරයට සකස් කළ විද්‍යුත් ප්‍රභවයක් හඳුන්වන නම කුමක්ද? ( ලකුණු 01 )

v. මෙම ඇටවුමෙන් ලැබෙන්නේ සරල ධාරාවක්ද? ප්‍රත්‍යාවර්ත්‍ය ධාරාවක්ද? ( ලකුණු 01 )

(B) **පස පාඩමට අදාලව සිදුකල ක්‍රියාකාරකමක් රූපයේ දැක්වේ.**





i. මෙම පරීක්ෂණය සිදු කිරීමට පෙර පරීක්ෂණ නල නටන ජලයේ තම්බා ගනී. එයට හේතුව කුමක්ද? ( ලකුණු 01 )

ii. නල 02ට පුළුන් ඇබ සවිකිරීමෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද? ( ලකුණු 01 )

iii. පැය කිහිපයකට පසු මෙයින් ලැබිය හැකි නිරීක්ෂණය කුමක්ද? ( ලකුණු 01 )

iv. එම නිරීක්ෂණය ලැබීමට හේතුව ලියන්න. ( ලකුණු 02 )

(C) **සංයුක්ත ආලෝක අන්වීක්ෂය භාවිතයෙන් විද්‍යාගාරය තුලදී නිරීක්ෂණය කරන ලද නිදර්ශක 02ක රූප සටහන් පහත දැක්වේ.**




i. A හා B හඳුනාගෙන නම් කරන්න. ( ලකුණු 02)

ii. ජීවීන්ගේ ව්‍යුහමය හා කෘත්‍යමය ඒකකය කුමක්ද? ( ලකුණු 02)

iii. ශාකයක ජලය හා ඛණිජ ලවණ පරිවහනය කරන පටකයෙහි නම ලියන්න. ( ලකුණු 01)

06. (A)




**රූපයේ දැක්වෙන්නේ දුමිඳු නිවසේ සිට පාසලට යන මාර්ගයයි**

i. නිවසේ සිට පාසලට ගොස් නැවත නිවසට පැමිණි විට,

a. දුමිඳු ගමන් කළ මුළු දුර ප්‍රමාණය කොපමණද? ( ලකුණු 01)

b. දුමිඳුගේ විස්තාපනය කොපමණද? ( ලකුණු 01)


Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ii. ඉහත සඳහන් භෞතික රාශී ඇසුරින් දෛශික රාශියක් නම් කරන්න. ( ලකුණු 01)

iii. එය දෛශික රාශියක් වීමට හේතුව පැහැදිලි කරන්න. ( ලකුණු 02)

(B)

**පාෂාණ චක්‍රය නිරූපණය කරන චිත්‍රයක් පහත දැක්වේ.**





i. ඉහත රූප සටහනේ දැක්වෙන ② අංකයට අදාළ ක්‍රියාවලිය කුමක්ද? ( ලකුණු 01)

ii. ගිනි කඳු පිපිරීමෙන් පිටතට පැමිණෙන ලාවා සිසිල්වීමෙන් සෑදෙන පාෂාණ වර්ගය කුමක්ද? එම පාෂාණ වර්ගය සඳහා උදාහරණ 2ක් ලියන්න.( ලකුණු 02)

iii. රූප සටහනේ X ලෙස යොදා ඇති හිස්තැනට සුදුසු වචනය ලියන්න. ( ලකුණු 01)

iv. පාෂාණ ජීර්ණය සඳහා ආම්ලික වර්ෂාව හේතු වේ. අම්ල වැසි ඇතිවීම කෙරෙහි හේතුවන වායුවක් සඳහන් කරන්න. ( ලකුණු 02)

(C)




**ක්ෂුද්‍ර වස්තු විශාල කර බැලීම සඳහා භාවිතයට ගන්නා සංයුක්ත ආලෝක අන්වීක්ෂයක් ඉහත දැක්වේ.**

i. රූපයේ A හා B නම් කරන්න. ( ලකුණු 02)

ii. ඉහත අන්වීක්ෂයෙන් නිදර්ශකයක් නිරීක්ෂණය කිරීමේදී නිදර්ශකයේ විශාලනය කොපමණද? ( ලකුණු 02)

iii. අන්වීක්ෂයක් පරිහරණයේදී සැලකිලිමත් විය යුතු කරුණක් ලියන්න. ( ලකුණු 01)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

වර්ෂ අවසාන පරීක්ෂණය
07 ශ්‍රේණිය
**විද්‍යාව පිළිතුරු පත්‍රය**

**I කොටස - පිළිතුරු පත්‍රය**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. 2 | 2. 3 | 3. 1 | 4. 2 | 5. 4 | 6. 2 | 7. 2 | 8. 3 | 9. 4 | 10. 1 |
| 11. 3 | 12. 2 | 13. 3 | 14. 4 | 15. 3 | 16. 1 | 17. 2 | 18. 3 | 19. 4 | 20. 4 |

**II කොටස - පිළිතුරු පත්‍රය**

01.A) i. සූර්ය ශක්තිය, ගලායන ජලය - (02) ii. ඩීසල් / ගල් අඟුරු - (01)
iii. දුම්රිය ධාවනයේදී පිටවන දුම /ගල් කැඩීමේදී නිකුත්වන දූවිලි අංශු ( 02 ) iv. කාබෝහයිඩ්‍රේට් / ලිපිඩ ( 01 )
v. විකිරණය (01)

B) i. වේශාන්තරය (01) ii. පේර කොළයා / කටුස්සා, වැනි ගැලපෙන පිළිතුරකට ( 01 )
iii. ආරක්ෂාව / ආහාර සපයා ගැනීම (01)

02.A) i. X - පත්‍ර අග්‍රය Y - පත්‍ර පාදය - (02) ii. ප්‍රභාසංශ්ලේෂණය - (01) iii. B ( 01 )

iv.

| | |
|---|---|
| 1. කඳ අතුබෙදී ඇත. | කඳ අතු බෙදී නැත |
| 2. බීජයේ පියළි 2කි | බීජයේ පියලි 1 කි |
| 3. මල් පෙති 4 ක් 5ක් හෝ ගුණාකාර | මල් පෙති 3ක් හෝ ගුණාකාර (02) |

B) i ශරීරය ප්‍රමාණවත් වර්ධනයක් නොදැක්වීම හෝ අධිවර්ධනය./බෝවන හෝ බෝ නොවන රෝගවලට පහසුවෙන් ගොදුරු වීම./දුර්වල වීම, අලස වීම./ඌනතා රෝග (01)
ii. විටමින් A/විටමින් D/විටමින් C (03)

B - කොටස

03.A) i. සුදුසු රූප සටහනකට (2). ii. රසායනික ශක්තිය ⟶ විද්‍යුත් ශක්තිය ⟶ ආලෝක ශක්තිය (01)
iii. ජූල් (J ) (1) iv. A - විභව ශක්තිය/B - චාලක ශක්තිය /C - ධ්වනි ශක්තිය/ D - තාප ශක්තිය/ E - රසායනික ශක්තිය (05)

B) i. ඉක්මනින් ජලය වාෂ්ප වීම. (01)
ii. සුදු පාට කුඩක් තැන්පත් වීම. (01)
iii. ප්‍රමාණවත් තරම් ඔක්සිජන් වාතය ලබා දීම. (01)
iv. තෙපාව (01) v. සෝඩියම් ක්ලෝරයිඩ් වැනි ලවණ දිය වී තිබේ (02)

04. A) i. A- පොලිස්ටයරින් කැබලි ඔබමොබ චලනය වීම. (01)/ B- ශබ්දය ක්‍රමයෙන් නොඇසි යාම (01)
ii. ධ්වනි සම්ප්‍රේෂණයට මාධ්‍යයක් අවශ්‍ය බව (01) iii. ධ්වනි ප්‍රභවයකින් හටගන්නා ධ්වනිය වෙනත් ස්ථානයකට පැතිරී යාම (01)
iv වායු < ද්‍රව < ඝන (01)
v. වාතය තුල ආලෝකයේ වේගය ධ්වනියේ වේගයට වඩා වැඩිවීම. (02)

B) i. A රසදිය / මාධ්‍යසාර උෂ්ණත්වය (01) B - වෛද්‍ය උෂ්ණත්ව මානය (01)
ii. වෛද්‍ය උෂ්ණත්ව මානයේ කඳෙහි කේශික සිදුරේ සියුම් නැම්මක් තිබීම/උෂ්ණත්ව පරාසය කෙටි වීම (02)
iii. රසදිය, මධ්‍යසාර (02) iv. අදාල නිවැරදි පිළිතුරකට (01) v. ප්‍රසාරණය (01) vi. 37°C (01)

05. A) i. කටුව උත්ක්‍රමණය වේ. ii. + අග්‍රය - තඹ - අග්‍රය - සින්ක් (02)
iii. හයිඩ්‍රොක්ලෝරික් අම්ලය /සල්ෆියුරික් අම්ලය (01) iv. සරල කෝෂයක් ලෙස (01) v. සරල ධාරාවක් (01)

B) i. ජීවානුහරණය කිරීම සඳහා (01) ii. වායුගෝලය සිට ක්ෂුද්‍රජීවින් ඇතුළු වීම වැළැක්වීම සඳහා (01)
iii. B නලයේ කිරි කැටිගැසීම iv. රත් නොකළ පස් වල ක්ෂුද්‍ර ජීවින් සිටිම.

C) i. A - රෝහියෝ යටි අපිචර්ම සෛල B - මිනිසාගේ කොපුල් සෛල (02)
ii. සෛලය (01) iii. සෛලම පටකය (01)

06) A) i. a. 1300m b. 0 (02) ii. විස්ථාපනය - (01)
iii. විශාලත්වයක් මෙන්ම දිශාවක් ද තිබීම. (02)

B) i. ආග්නේය පාෂාණ ජීර්ණය වෙමින් ගංගා ඔස්සේ මුහුදට යාම (01)
ii. ආග්නේය පාෂාණ , ග්‍රැනයිට් හෝ බැසෝල්ට් (02) iii. මැග්මා (01) iv සල්ෆර් ඩයොක්සයිඩ් (01)

C) i. A උපනෙත B අවනෙත (02) ii. 10 x 40 = 400 (02) iii. සුදුසු පිළිතුරකට - (01)